# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

**PROCUREMENT FOR THE SUPPLY, INSTALLATION, COMMISSIONING AND HANDING OVER OF 01 NO. OF CNC SURFACE WHEEL LATHE MACHINE FOR SRI LANKA RAILWAYS**

**SRS/F. 8030**

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, තැ.පෙ. 355, කොළඹ ශ්‍රී ලංකාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත Supply of 01 No. of CNC Surface Wheel Lathe Machine යෝග්‍යතාපූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවා සිටී. ලංසුකරුවන්ට ඇටෝර්නි බලය සහිත බලයලත් පිළිගත් නියෝජිතයෙකු හරහා තම ලංසු ඉදිරිපත් කළ හැක.

2 ලංසු කැඳවීම **ජාත්‍යන්තර තරගකාරී ලංසු පටිපාටිය (ICB)** අනුව සිදු කෙරෙනු ඇත.

3 උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයෙන් ලංසු ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි දුර තොරතුරු ලබා ගැනීමට හැකි ය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

| | |
|---|---|
| **දුරකථන අංක** | **: + 94 (11) 2438078 හෝ + 94(11) 4600202** |
| **ෆැක්ස් අංකය** | **: + 94 (11) 2432044** |
| **ඊ මේල්** | **: srs.slr@gmail.com, tender1@railway.gov.lk** |
| **වෙබ් අඩවිය** | **: www.railway.gov.lk** |

4 පහත අවශ්‍යතා සපුරාලන ලංසුකරු ලංසු තැබීමට සුදුසුකම් ලබයි.

- සමාන ආකාරයේ CNC Surface wheel lathe machines නිෂ්පාදනය සම්බන්ධයෙන් වසර 10ක පළපුරුද්ද, ඒවා අපනයනය කිරීමේ වසර 05 ක පළපුරුද්ද සහ එම යන්ත්‍ර නිෂ්පාදනය සම්බන්ධයෙන් වලංගු ISO හෝ එයට සමාන සහතික ඇති නිෂ්පාදකයන් වීම.
- නිෂ්පාදකයා සහ ලංසුකරුවා එකම පුද්ගලයා හෝ ආයතනය නොවන්නේ නම්, තම රටෙන් බැහැරව මෙයට සමාන ස්වභාවයේ කොන්ත්‍රාත්තු සාර්ථකව සම්පූර්ණ කිරීමේ පළපුරුද්ද සහ ශ්‍රී ලංකාව තුළ තාක්ෂණික සහය සැපයීමේ හැකියාව සහිත වීම.
- දුම්රිය යන්ත්‍ර සහ මැදිරි හෝ බර යන්ත්‍ර වැනි ඉහළ අගයකින් යුතු සැපයුම් හැසිරවීමේ පළපුරුද්ද ඇති හෝ අවසන් වසර 5 තුළ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවෙකු වීම සහ තමන්ගේම වූ වැඩපොළ සහිත දේශීය නියෝජිතයන්.

5. සෑම ලංසුවක්ම ලංසු සුරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු සුරක්ෂණ මුදල **රු. 4,000,000.00 ක්** විය යුතු අතර, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත බැංකුවක් විසින් නිකුත් කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් විය යුතු ය.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.12.05 සිට 2025.01.16 දක්වා ප.ව.3.00** තෙක් (ශ්‍රී ලංකා වේලාවෙන්) **නැවත ගෙවනු නොලබන රු.55,000/-** ක් මාරු කළ හැකි ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන), දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10** යන ලිපිනයට යොමු කිරීමෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

7. පෙර ලංසු රැස්වීම **2024.12.20 දින පෙ.ව. 10.00ට රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුවේදී** පැවැත්වේ.

8. ලංසු **2025.01.17 දින ප.ව. 2.00 හෝ ඊට පෙර** පහත ලිපිනයට භාර දිය යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**2025.01.17 ප.ව.2.00** කාමර අංක 01, තුන්වන මහල, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, තැ.පෙ.1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව හිදී ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**
**යොමු අංක SRS/F.8030**

SELACINE

වතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද